Embassy of the United States of America

Colombo

# PRESS RELEASE

Public Affairs Section

Tel: +94 (1) 249-8100 ● Fax: +94 (1) 244-9070

Email: shenjy@state.gov ● http://lk.usembassy.gov

Release No. 20161215

## අවුරුදු පහක ප්‍රතිපාදනයක් සඳහා ඇමෙරිකාවේ Millenium Challenge Corporation විසින් ශ්‍රී ලංකාව තෝරා ගැනේ.

වොෂින්ටෝන් ඩී. සී., දෙසැම්බර් 14: ඇමෙරිකාවේ Millenium Challenge Corporation (MCC)යේ - Compact වැඩසටහන විසින් ආර්ථික වර්ධනයට උර දීම සහ දරිද්‍රතාව අඩු කිරීම අරමුණු කර ගත් පස් වසරක ප්‍රතිපාදනයක් සඳහා ශ්‍රී ලංකාව, බුර්කිනා ෆසෝ සහ තුනීසියාව යන රටවල් තෝරා ගන්න ලදී.

ශ්‍රී ලංකා ජනයා වෙනුවෙන් ඇමෙරිකාව ලබා දී ඇති වසර 60ක සංවර්ධන හවුලට මෙම MCC සහය රුකුලක් වන්නේය." යැයි ඇමෙරිකානු තානාපති අතුල් කෙශාප් පැවසීය.

MCC සහාය ලබා දීමට සලකා බලනු ලබන්නේ, ස්වාධීන-ප්‍රතිපත්ති සංචිතවල වාර්ෂික MCC ලකුණු පුවරුවට අනුව, සාධාරණ සහ ප්‍රජාතන්ත්‍රවාදී පාලනයට, ආර්ථික නිදහසට සහ තම ජනයා වෙනුවෙන් ආයෝජනය කිරීමට කැප වී සිටින රටවල්වලටය.

"දූෂණයට එරෙහිව ක්‍රියා කරන, කාන්තා අයිතීන්ට සහ නීතියට ගරු කිරීම ඇතුළු යහපාලනයට කැපවන සංවර්ධිත රටවල් සමග මෙලෙස සම්බන්ධ වීම තුලින් දරිද්‍රතාවය අඩු කර මින්සුන්ගේ ජීවිත වෙනස් කිරීමට හැකි වන්නේය" යැයි MCCයේ ප්‍රධාන විධායක නිලධාරී ඩනා ජේ. හයිඩ් විසින් පවසන ලදී.

2015 වසරේ දෙසැම්බර් මස MCCයේ ThreshHold වැඩසටහනට ශ්‍රීලංකාව තේරී පත්විය. ප්‍රජාතන්ත්‍රවාදී අයිතීන් වෙනුවෙන් පෙනී සිට ඉහල ලකුණු ලබා ගැනීමට හැකි වීම තුලින් ශ්‍රී ලංකාව MCCයේ Compact වැඩසටහනට ඇතුළු වීමට සමත් විය.

ශ්‍රී ලංකාව සහ බුර්කිනා ෆසෝ යන රටවල ව්‍යවස්ථාපිත අධිකාරීන් ඇතුළුව දේශීය සහ කලාපීය ආර්ථික වර්ධනයට අවහිර වන කරුණු සහ ආයෝජන අවස්ථා අධ්‍යයනය කරන ලෙස විශේෂ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් MCCයට නිර්දේශ කරන ලදී.